# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2018 මාර්තු මස 20 වන දින පෙ.ව. 9.30 ට
# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI/(1)/18/06

අ. බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන (NADA) ප්‍රධාන රංග ශාලාව නවීකරණය සහ කුඩා රංග ශාලාව අංග සම්පූර්ණ රංග ශාලාවක් බවට පත් කිරීමට සහා සම්මත යෝජනා ඇති බව දන්නේද?

ආ. අයවැය සඳහා විශේෂ යෝජනා - 2018 ලෙසද, ඒ පිළිබඳව ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිඛිත ඉල්ලීම් කර ඇති බව දන්නේ ද?

ඇ. 2018 වසරේ සංවර්ධන කාර්යයක් ලෙස ඒ පිළිබඳව ගෙන ඇති පියවර කවරේ ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු - I

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව :

"අද දින (2018.03.20 දින) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක (01) හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 52(5), 57(1), 57(4), හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."

# සභාවේ කටයුතු – II

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියඃ

"ශ්‍රී ලංකාව වසර 2500 කට එහා ගිය වැදගත් ඉතිහාසයක් ඇති රටක් ලෙස, අප විසින් උදම් අනමින් සිටිය ද, අපගෙන් පසු එන පරපුරට සාරගර්භව අභිමානයකින් යුතුව, වර්ණනා කල හැකි අතීතයක් හිමි වන පරිදි, වර්තමානයේ දේශපාලන නායකයන් වන අප විසින් දියුණු රටක් නිර්මාණය කිරීමට කටයුතු කර නොතැබුවහොත්, එය අපගේ වගකීමක් පැහැර හැරියා වේ. එහෙයින් ජාතික ධනය, බලය, මෙන්ම, අප හැමගේම සුරු විරුකම්, හැකියාවන්, උපරිමයෙන් රටේ දියුණුව වෙනුවෙන් යොදවා, ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නගා, සැමදා ඇති වන ගංවතුර, නියඟ ආදී ස්වාභාවික විපත් වලින් මෙන්ම, අනාගතයේ ඇති විය හැකි ගැටළු ද, කලින්ම හඳුනාගෙන, ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ, මෙරටේ ජාතික, ආගමික, සමාජමය, බලමුළු එක්තැන් කර සංහිඳියාවකින් යුතුව, එක මඟක් ගෙන, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ද, ආරක්ෂා කර ගනිමින්, සීඝ්‍ර දියුණුවක් කරා, මෙම රට රැගෙන යාමට සියළුම මහජන නියෝජිතයින් පෙරමුණ ගත යුතු යැයි ද, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි ද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/VI/(1)/17/11)

### 02. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමියඃ

"මෙරට පිළිගත් නීතිය අනුව ක්‍රියාත්මක යම් අධිකරණයක අධිකරණ බල සීමාව අධිකරණ සංවිධාන පනතේ දෙවන (2) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිසම සහ අභියාචනාධිකරණ සභාපතිවරයා විමසා අධිකරණ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ යුතු වේ. එවැනි නීති ප්‍රතිපාදනයන් සකසා ඇත්තේ පවතින අධිකරණ ක්‍රියාත්මක වන ආකාරයන් සහ ඒවායේ මතුවන ප්‍රායෝගික ගැටලු පිළිබඳව මනා අවබෝධයක් ඉහත කී පුද්ගලයන් හා ආයතන විසින් නිරන්තරයෙන් ලබාගන්නා හෙයිනි. එහෙත් මෑතකදී අධිකරණ බල සීමා නිර්ණයන් සිදු කිරීමේදී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකර ක්‍රියා කර ඇති අවස්ථාවන්ද දක්නට තිබේ. එහෙයින් අධිකරණ ක්ෂේත්‍රය කෙරේ පවතින මහජන විශ්වාසය වැඩිදියුණු වන ආකාරයෙන් එකී සියලු සීමා නිර්ණයන් නිසි ඇගයීමකට ලක් කර යම් වරදක් සිදුව ඇත්නම් එම වැරදි නීතිමය රාමුව තුල නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/VI/(1)/17/12)

# XI. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)!

යෝජනාව :

2018 පරිපූර්ණ ඇස්තමේන්තුව - 01

"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශවල මතු දක්වෙන අවශ්‍යතා වෙනුවෙන් අමතර ප්‍රතිපාදන සලසා දීම සඳහා, එනම්,

- පළාත තුල වැඩ අවසන් නොකළ පාසැල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය පාසැල් ගොඩනැගිලි ඉදි කිරීම් හා අධ්‍යාපන ක්ෂෙත්‍රයේ අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමද,

- පළාත් රෝහල්වල අත්‍යවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, අළුත්වැඩියාව හා නවීකරණය කිරීම, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වියදම් දැරීම වෙනුවෙන් ප්‍රතිපාදන සැලසීම ද,

- අනෙකුත් පළාත් සභා ආයතන ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යාවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් හා අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම ද යන අවශ්‍යතා වෙනුවෙන්,

2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් හා ඒ සඳහා අවශ්‍ය රුපියල් තුන් බිලියන තිස්පස් මිලියන පනස් පන් දහසක් (රු.3,035,055,000/=) වන මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබාගැනීම මගින් පියවා ගැනීමට ද අපේක්ෂිත ව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව-01 අනුමත කළ යුතුය."

[ 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 හා එම පරිපූරක ඇස්තමේන්තුව මගින් වියදම් කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන කටයුතුවලට අදාල ව්‍යාපෘති යෝජනා පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත මේ සමග එවා ඇත. ]

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.):

යෝජනාව :

2018 පරිපූරක ඇස්තමේන්තුව - 01ට අදාල විසර්ජන ප්‍රඥප්තිය

"2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 01 සඳහා අවශ්‍ය රුපියල් තුන් බිලියන තිස් පස් මිලියන පනස් පන් දහසක් (රු.3,035,055,000/=) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාරගැනීමටත් බලය දෙනු ලබන 2018 අංක ..... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."

03. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.):

යෝජනාව :

2016 අංක 03 දරණ විසර්ජන ප්‍රඥප්තිය - 07 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2017 වර්ෂය

"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2017, නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේදී, 2016 අංක 03 දරණ විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,

එම සංශෝධනයන් සිදුකිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත් ව ලබා දී ඇති හෙයින් ද, එම උපලේඛණයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි."

04. ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා, (බ.ප.):

නව කාර්ය පටිපාටි රීති

"2018 මාර්තු මස 20 වන දින එනම් අද දින, 2018 ජනවාරි මස 09 වන දින නිල වාර්තාව සමඟ ඇමුණුමක් ලෙස සභාගත කරනු ලබන : 1997 ඔක්තෝබර් මස 09 වන දින බලාත්මක වූ රීතිමාලා පුස්තකයට ඉදිරිපත් කරන ලද සියලුම සංශෝධනයන් ඇතුළත්ව 2017 නොවැම්බර් මස 07 වන දින සභාවට ඉදිරිපත් කොට 2017 නොවැම්බර් මස 14 වන දින සහ 2018 ජනවාරි මස 09 වන දින සාකච්ඡා කොට 2018 ජනවාරි මස 09 වන දින සභා සම්මත වුණු නව කාර්ය පටිපාටි රීතිමාලා පුස්තකයේ ඇතුළත් මෙම සියලු රීතින් 2018 මැයි මස 08 වන දින සිට බලපැවැත්විය යුතුය"

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.03.07 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.